සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 9 - ශ්‍රේණිය

## ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා

**නම/විභාග අංකය :-** ......................................................... **කාලය: පැය 02යි.**

උපදෙස්
- පාසල තුළ ව්‍යාපෘති සම්බන්ධව කරනු ලැබූ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා ලකුණු 20ක් හිමි වේ.
- බහුවරණ 20 සඳහා ලකුණු 40 ක් ද ව්‍යුහගත ප්‍රශ්න 03ක් තෝරාගෙන ලිවීමෙන් ලකුණු 40 ක් ලබා දේ.

---

### I - කොටස

(01) බහු වාර්ෂික ශාකවල අතු සහ මුල් දීර්ඝ කාලයක් තිස්සේ කප්පාදු කරමින් නඩත්තු කිරීමෙන් ලබා ගන්නා කුඩා ශාක හඳුන්වන්නේ
(1) බොන්සායි ලෙසයි (2) ක්ෂුද්‍රරූපී උද්‍යාන ලෙසයි (3) කොකිඩාමා ලෙසයි (4) සිගිති උද්‍යාන ලෙසයි

(02) අසුරන ලද එළවළු, පළතුරු බීජ සහ බඳුන්ගත පැල වර්ග විකිණීමේ දී බෝගවල අගය වැඩි කර ගතහැකි ක්‍රමයකි.
(1) නොමිලේ බීජ හා පැල ලබාදීමෙන්
(2) අඩු මිලට බීජ හා පැල ලබාදීමෙන්
(3) බෝගවලට අදාළ මහා පිළිවෙත් අඩංගු පත්‍රිකාවක් ලබා දීමෙන්
(4) බෝගය සමග වෙනත් බෝගයක් ලබා දීමෙන්

(03) අඛණ්ඩව මුගුණුවැන්න අස්වැන්නක් ලබා ගැනීමට මුගුණුවැන්න ඉත්තක් දඬු වර්ග කීයකට වෙන් කර ගත හැකිද?
(1) දඬු වර්ග 2 (2) දඬු වර්ග 5 (3) දඬු වර්ග 4 (4) දඬු වර්ග 3

(04) සජීවි කලා නිර්මාණ (Live Art Gardening) තැබීමට සුදුසුම ස්ථානයක් වන්නේ
(1) කෑම මේසය මත (2) නිවසේ මුල්ලක
(3) බිත්තියක එල්ලා තැබීම (4) විසිත්ත කාමරයේ ගෙබිම මත

(05) ඉහළ අස්වනු අපේක්ෂාවෙන් යොදනු ලබන උපාය මාර්ගයක් නොවන්නේ
(1) නව බෝග ප්‍රභේද අභිජනනය කිරීම (2) අධික ලෙස රසායකින පොහොර භාවිතය
(3) අධික ලෙස පළිබෝධනාශක භාවිතය (4) වගා ණය ලබා දීම

(06) අඛණ්ඩව වගා කිරීමෙන් වගාවට හිතකර පාංශු ගුණාංග පිරිහීම සිදු වේ. එවිට පුනරුත්ථාපන බෝගයක් ලෙස සිටුවිය හැකි වන්නේ
(1) ගෝතමාලා (2) ගොටුකොළ
(3) ග්ලිරිසීඩියා (4) පියුරේරියා

(07) ආහාර මූලික කරගත් කර්මාන්තයක් සැලසුම් කිරීමේදී
(1) ප්‍රදේශයේ පවතින සුලබ අමුද්‍රව්‍ය යොදාගත යුතුය
(2) ප්‍රදේශයේ පවතින දුලබ අමුද්‍රව්‍ය යොදා ගත යුතුය
(3) ආනයනික අමුද්‍රව්‍ය යොදාගත යුතුය
(4) වැඩි පාරිභෝගික ඉල්ලුමක් නොමැති ආහාර ද්‍රව්‍ය හඳුනාගත යුතුය

(08) ආහාරවල බහුලව දක්නට ලැබෙන ස්වභාවික වර්ණ යුගලයක් වන්නේ
(1) රතු සහ කළු (2) කහ සහ කොළ (3) සුදු සහ කළු (4) කොළ සහ කළු

(09) වාහන එන්ජින්වලින් මුදාහැරෙන පරිසර දූෂණයට හේතුවන වායු වර්ග දෙකක් වන්නේ
(1) ඔක්සිජන් හා නයිට්‍රජන් (2) සෝඩියම් හා ක්ලෝරීන්
(3) මීතේන් හා සෝඩියම් (4) කාබන් මොනොක්සයිඩ් හා නයිට්‍රස්ඔක්සයිඩ්

(10) පහත දැක්වෙන ලාංඡන දෙකෙන් අදහස් වන්නේ

(1) ගස් වගා කළ යුතු බවයි
(2) පරිසර හිතකාමී බවයි
(3) ගස් ආරක්ෂා කළ යුතු බවයි
(4) හරිත පරිසරයක් බවයි

(11) ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේදී ප්‍රථමයෙන් ම ඔබ කළ යුත්තේ
(1) නිර්මාණ සාරාංශය සකස් කිරීමයි
(2) පිරිවිතර සකස් කිරීමය
(3) ගැටලුමය අවස්ථාව හා ඊට විසඳුම් ක්‍රියාමාර්ග සෙවීම
(4) කාලරාමුව සැකසීමයි

(12) කුඩා ව්‍යාපාරවල දක්නට ලැබෙන පොදු ලක්ෂණයක් වන්නේ කුමක්ද?
(1) විශාල සේවක සංඛ්‍යාවක් සිටීම
(2) මහා පරිමාණ යන්ත්‍රසූත්‍ර භාවිතා නොකිරීම
(3) වෙළඳ පොළ සීමාරහිත වීම
(4) විශාල ප්‍රාග්ධනයක් ආයෝජනය කර තිබීම

(13) පසුගිය දශක කිහිපය තුළ සිට ම ව්‍යාපාරික ක්ෂේත්‍රයට කාන්තා ව්‍යවසායකයන්ගේ නැඹුරුතාව වැඩි වී ඇත. එයට හේතුවක් වන්නේ
(1) ගේදොර වැඩවලින් නිදහස් වීමේ අරමුණයි
(2) පවුලේ ආදායම් තත්ත්වය වැඩිකර ගැනීමේ අවශ්‍යතාවයයි
(3) නිවසේ සෙසු අය කරන බලපෑමයි
(4) කාන්තා අධ්‍යාපන මට්ටම පහළ යාමයි

(14) ව්‍යාපාරයක මුදල් ලේඛනයක් යනු
(1) ආයෝජනය කරන මුදල් සටහන් කර තබන ලේඛනයයි
(2) ව්‍යාපාරයේ වියදම් පෙන්නුම් කරන ලේඛනයයි
(3) ව්‍යාපාරයේ ලාභ අලාභ සොයාගන්නා ලේඛනයයි
(4) ව්‍යාපාරයේ මුදල් ලැබීම් හා මුදල් ගෙවීම් සටහන් කරන ලේඛනයයි

(15) ව්‍යාපාරික කටයුතු සාර්ථකව කරගෙන යාම සඳහා විවිධ සේවා සහාය වේ. එම සේවා හඳුන්වනුයේ
(1) ප්‍රචාරණ සේවා ලෙසයි
(2) නිෂ්පාදන සේවා ලෙසයි
(3) උපකාරක සේවා ලෙසය
(4) රාජ්‍ය සේවා ලෙසයි

(16) සියලුම බැංකුවල බැංකුකරුවා ලෙස ක්‍රියාත්මක වන්නේ
(1) මහජන බැංකුවයි
(2) ලංකා බැංකුවයි
(3) ජාතික ඉතිරි කිරීමේ බැංකුවයි
(4) ශ්‍රී ලංකා මහා බැංකුවයි

(17) ධාරිත්‍රකයක (Capacitors) සංකේතය වන්නේ

(1) 
(2) 
(3) 
(4) 

18) ජල මාර්ගයකින් $90^0$ කින් දිශාව වෙනස්කර තවත් ජලමාර්ගයක් ලබා ගැනීමට භාවිතා කරන උපාංගයක් වන්නේ
(1) T සන්ධියයි
(2) කරාම කෙවෙනිය
(3) වැලමිට නැම්ම
(4) සමාන කෙවෙනිය

(19) ශ්‍රී ලංකාවේ විවිධ පළාත්වල විවිධ ආහාර වර්ග සුලබ වශයෙන් දක්නට ලැබේ. දකුණු පළාතේ සුලබ වශයෙන් දක්නට ඇති ආහාර වර්ග දෙක කුමක්ද?

(1) මාළු හා මී කිරි (2) මැංගුස් හා දූරියන්
(3) ස්ට්‍රෝබෙරි හා අර්තාපල් (4) රතුලූණු හා තල්

(20) නව ව්‍යාපාරයක් ඇරඹීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ලබාදෙන රාජ්‍ය ආයතනයකි

(1) තරුණසේවා සභාව
(2) ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
(3) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
(4) අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## <u>II - කොටස</u>

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න දෙකක් තෝරාගෙන පිළිතුරු සපයන්න.

(01) (i) වර්තමානයේ කාර්ය බහුලතාවය මත එදිනෙදා ගෘහ කාර්යන් කර ගැනීමට යොදා ගන්නා නවීන ගෘහ උපකරණ 5ක් නම් කරන්න (ලකුණු 5)

(ii) ඔබ නම් කළ ගෘහ උපකරණවල ඇතිවිය හැකි සරල දෝෂ 03ක් නම් කරන්න. (ලකුණු 5)

(iii) තාක්ෂණික විෂය දැනුමක් ඇති සිසුන් වන ඔබට පාසලේදී එම සේවය ලබාදිය හැකි අවස්ථා 04ක් නම් කරන්න. (ලකුණු 4)

(iv) සරල තාක්ෂණික ශිල්පීය ක්‍රම හා උපකරණ යොදා ගනිමින් පොල්ලෙලි හා පොල්කටු භාවිතා කරමින් කළ හැකි සරල නිර්මාණ 06ක් නම් කරන්න. (ලකුණු 6)

(මුළු ලකුණු 20)

(02) (i) බෝග වගාව පිණිස වනාන්තර හෙළි කිරීම නිසා වන ආවරණ හීන වී යයි. මේ මගින් සිදුවන අහිතකර බලපෑම් 03ක් නම් කරන්න. (ලකුණු 6)

(ii) පාංශු බාදනය හා පාංශු හායනය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 4)

(මුළු ලකුණු 10)

(03) (i) ව්‍යවසායකත්වය යනු කුමක්ද? (ලකුණු 2)

(ii) ව්‍යවසායකත්ව ගති ලක්ෂණ 03ක් නම් කරන්න (ලකුණු 6)

(iii) ඉන් එක් ගති ලක්ෂනයක් කෙටියෙන් විස්තර කරන්න (ලකුණු 2)

(මුළු ලකුණු 10)

(04) (i) ආහාර විවිධාංගීකරණයේදී සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් නම් කරන්න. (ලකුණු 5)

(ii) ඔබ කැමති අමුද්‍රව්‍යයක් ඇසුරෙන් ආහාර විවිධාංගීකරණය නිදසුනක් මගින් ඉදිරිපත් කරන්න (ලකුණු 5)

(මුළු ලකුණු 10)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 9 - ශ්‍රේණිය

## ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා - පිළිතුරු

I - කොටස

| | | | |
|---|---|---|---|
| (01) | 1 | (11) | 3 |
| (02) | 3 | (12) | 2 |
| (03) | 4 | (13) | 2 |
| (04) | 3 | (14) | 4 |
| (05) | 4 | (15) | 3 |
| (06) | 1 | (16) | 4 |
| (07) | 1 | (17) | 4 |
| (08) | 2 | (18) | 1 |
| (09) | 4 | (19) | 1 |
| (10) | 2 | (20) | 2 |

(ලකුණු 2 × 20 = 4)

II කොටස

(01) (i) ගෑස් උදුන/පීඩන උදුන/බ්ලෙන්ඩරය/ග්‍රයින්ඩරය/බත් පිසිනය (රයිස් කුකර්) රෙදි සෝදන යන්ත්‍රය/වැකුම් ක්ලීනරය/මල්ටි කුකර් (බහු විධ කෑම පිසීමේ උදුන) මැජික් බුලට් (විවිධ හැඩ අනුව එළවළු පළතුරු කැපීමේ යන්ත්‍රය) වතුර පිල්ටරය (ලකුණු 05)

(ii)
- සර්ෂණය නිසා ඇතිවන දෝෂ
- තල මුවහත් නොවීම
- චලනය වන කොටස්වල ඇති වන දෝෂ
- විද්‍යුත් උපකරණ සඳහා විදුලි සැපයුම සම්බන්ධයෙන් ඇතිවන දෝෂ (ලකුණු 05)

(iii)
- ජල කරාමයක් කැඩුණු විට නැවත සකස් කර ගැනීම
- පාසල් ගෙවත්තට/වගා බිමට ජලය රැගෙන යාමට ජලනල දිගුවක් සකස් කර ගැනීම
- පන්ති කාමරයේ දොර අගුළු ඇරීමට, වැසීමට නොහැකි අවස්ථාවල සකස් කිරීම
- පරිඝණකවල ඇතිවන්නා වූ සුළු දෝෂ සකස් කිරීම
- පාසලේ සන්නිවේදන උපකරණවල (ස්පීකර්, මයික්, සීනුව) ඇතිවන සුළු දෝෂ සකස් කිරීම
- පාසලේ භූමි අලංකරණ කටයුතුවලදී (ලකුණු 04)

(iv) ඉදල්/කොහු සැකසීම, ඉරටු ලාම්පු කවර, වගා බඳුන්, පොල් කටු පහන්, පොල්කටු හැඳි/තෙල් හැඳි, පැන, පැන්සල් රඳවන, පාපිසි, බිත්ති සැරසිලි, මේස දරණු, පොල්කටු ආභරණ, පොල්කටු කෝප්ප, ලුණු දමන බඳුන්, ඇඳුම් සඳහා පොල්කටු බොත්තම්, බකල් සෑදීම, කුරුළු කූඩු (ලකුණු 06)

(02) (i)
- ජෛව විවිධත්වය විනාශ වීම
- ජල මූලාශ්‍ර සිඳී යාම
- වර්ෂාපතනය අඩු වීම
- පරිසර උෂ්ණත්වය වැඩිවීම
- පාංශු ඛාදනය සිදුවීම (ලකුණු 06)

(ii) <u>පාංශු ඛාදනය</u>
වගාවට බිම් සැකසීමේදී නිතර නිතර පස බුරුල් කිරීමෙන්, වන ආවරණය ඉවත් වීමෙන් වර්ෂා ජලය කෙලින්ම භූමිය මත පතිත වීමෙන් පස සෝදා යාම පාංශු ඛාදනයයි. (ලකුණු 02)
<u>පාංශු හායනය</u>
පාංශු ඛාදනය නිසා බෝග වගාවට සුදුසු පාංශු ගුණාංග පිරිහීම (පාංශු ගුණාංග අඩුවීම, නැතිවීම) පාංශු හායනයයි. (ලකුණු 02)

(03) (i) කිසියම් ප්‍රතිලාභයක් ළඟා කර ගැනීම සඳහා යමක් කිරීමේ නව මාර්ග උත්පාදනය කිරීම ව්‍යවසායකත්වය වේ. විවිධ පුද්ගලයන් තම තමන්ගේ ව්‍යවසායකත්ව ගති ලක්ෂණ ක්‍රියාවේ යොදවා තම අභිමතාර්ථ මුදුන්පත් කර ගනිති (ලකුණු 02)

(ii) නායකත්ව, නවෝත්පාදනය, තීරණ ගැනීම, අවදානම් දැරීම, කැපවීම, වගකීම, ගැටලු විසඳීමේ හැකියාව (ලකුණු 06)

(iii) අදාළ ගති ලක්ෂණ කෙටියෙන් විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 02)

(04) (i)
- ආහාරයේ ගුණාත්මක බව රැක ගැනීම
- ආහාරයේ සෞඛ්‍යාරක්ෂිත බව රැකෙන පරිදි සකස් කිරීම
- ආහාරයේ පෝෂණ ගුණය රැකෙන පරිදි සකස් කිරීම (ලකුණු 05)

(ii) දරුවන් ඉදිරිපත් කරන නිවැරදි සරල නිදසුන් සඳහා ලකුණු ලබා දෙන්න (ලකුණු 05)